රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය

அரசாங்க நிருவாகச் சுற்றறிக்கை

**Public Administration Circular**

අංකය
இல.
No. 38

# විවාහක නිලධාරීන්ට දීමනා

## திருமணமாகிய உத்தியோகத்தர்கட்குப் படி

## Allowance to Married Officers

ආයතන චක්‍රලේඛ මාලා අංකය
தாபனத் தொடர் இல.
Establishments Series No. 30

රජයේ මුද්‍රණාලයේ මුද්‍රිතයි

මිළ/விலை/Price : -/10

තැපැල් ගාස්තුව/தபாற் செலவு/Postage : -/10

## විවාහක නිලධාරීන්ට දීමනාව

" විවාහක නිලධාරීන්ට දීමනා " ගෙවීම පිළිබඳ උපදෙස් ඇතුළත් අංක 795 හා 1970.4.10
දින දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ 2(ඌ) ඡේදයට අවධානය යොමු කරවනු කැමැත්තෙමි.

2. රජයේ නිලධාරියකුගේ භාර්යාව/ස්වාමිපුරුෂයා එවැනි දීමනාවක් ගෙවන රජයේ ,
සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ (විශ්ව විද්‍යාල, මහ බැංකුව, වෙනත් රජයේ බැංකු
ආදිය ඇතුළු) වෙනත් එවැනි රජයේ ආයතනයක සේවය කරන අවස්ථාවන්හිදී, දීමනාව ගෙවිය
යුත්තේ අඹු සැමි දෙදෙනාගෙන් එක් කෙනෙකුට පමණි. ප්‍රස්තුත භාණ්ඩාගාර චක්‍රලේඛයේ
2(අ) ඡේදයේ දක්වෙන පරිදි වඩා ඉහළ දීමනාව හිමි වන වැටුප මත එම දීමනාව ගෙවිය යුතුය.

3. නියමිත දීමනාවෙන් අඩ බැගින් ගෙවීමට මෙකී අවස්ථාවන්හිදී අදාල රජයේ දෙපාර්ත
මේන්තුවට හා රජයේ සංස්ථාවට හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයට හෝ වෙනත් ආයතනයට
හැකිය. එසේ නැතහොත්, අඹු සැමි දෙදෙනාගෙන් රජයේ සංස්ථාවේ, ව්‍යවස්ථාපිත මණ්ඩලයේ
හෝ වෙනත් රජයේ ආයතනයේ සේවය කරන තැනැත්තාට හිමි වන්නේ වඩා පහළ දීමනාව
නම්, තමන් යටතේ සේවය කරන තැනැත්තාට එම දීමනාව සම්පූර්ණයෙන් ගෙවීමට සංස්ථාවට,
මණ්ඩලයට හෝ ආයතනයට හැකි අතර, රජයේ සංස්ථාව, ව්‍යවස්ථාපිත මණ්ඩලය හෝ වෙනත්
ආයතනය විසින් ගෙවනු ලබන වඩා පහළ දීමනාවත් රජයේ දෙපාර්තමේන්තුවේ සිටින අනිත්
තැනැත්තාට හිමි වඩා ඉහළ දීමනාවත් අතර වෙනස ගෙවීමට ඒ අනිත් තැනැත්තා සේවය කරන
රජයේ දෙපාර්තමේන්තුවට හැකිය.

බී. මහාදේව

රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු
අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1971 ජූලි 23 දින,
කොළඹ 7,
ටොරින්ටන් චතුරශ්‍රයේ, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු භාර අමාත්‍යාංශයේදීය.

අංක : 1126 ඊ/1 සීබී.